THE JOURNAL OF LANGUAGE AND CULTURE

Volume 2 - Issue I
October-November 2024

T J O L C
ISSN 2806-5395

Category: Research Article

# සීගිරි කාන්තා බිතුසිතුවම් පිළිබඳ ප්‍රකාශිත මත අධ්‍යයනයේ දී සීගිරි ගීවල උපයෝගිතාව පිළිබඳ විමර්ශනයක්

ඩබ්. එම්. කල්‍යාණි විජේසුන්දර

ARTICLE DETAILS

Published Online & Printed
October-November 2024

*Author:*

**Dr. W. M. Kalyani Wijesundara**
Department of Sinhala
University of Colombo.
**Email:** *kalyani@sinh.cmb.ac.lk*

***Keywords***:
comparative analysis, sigiri murals, sigiri graffiti, sigiri mural's opinions,

## Abstract

Professor Senarath Paranavithana has published 685 Sigiri songs on the Sigiri Mirror Wall under the name Sigiri Graffiti. Sigiri murals have been the subject of many Sigiri Graffiti written on Sigiri walls. Sigiriya mirror wall and graffiti are a source of various social information. Accordingly, 'What is the utility of Sigiri Graffiti in the study of the opinions presented about Sigiri women's murals? This research was conducted concerning this research problem. Some who wrote Sigiriya graffiti saw murals and created graffiti using them as subjects. Therefore, this research was conducted based on the assumption that we can understand from the women depicted in the murals that Sigiri murals were inspired by the graffiti. The research was conducted under the qualitative research method. Data through a literature review from library references was collected. A comparative analysis of that data with the views presented regarding Sigiri paintings Usefulness of Sigiri Graffiti in Studying Opinions Presented about Sigiri Murals in Association This research was conducted concerning.

## හැඳින්වීම

සීගිරිය යනු සීගිරි බිතු සිතුවම් සහ සීගිරි ගී නිසා සුප්‍රසිද්ධියට පත් වූ ස්ථානයකි. පුරාණ සංස්කෘතියේ විශේෂත්වය ලොවට විශද කරන ප්‍රබල නිර්මාණ වශයෙන් සීගිරි බිතුසිතුවම් සහ සීගිරි ගී හැඳින්විය හැකි ය. කැටපත් පවුරේ සීගිරි ගී අතර සීගිරිය නැරඹීමට දිවයිනේ විවිධ ප්‍රදේශවලින් පැමිණි ජනයා ප්‍රධාන වශයෙන් බිතුසිතුවම් අද්දැකීම් කර ගනිමින් කළ නිර්මාණ බොහෝ ය. පරණවිතාන විසින් කියවා ප්‍රකාශයට පත් කරන ලද ගී 685න් ගී 600කට අධික ප්‍රමාණයකට වස්තු විෂය වී ඇත්තේ සීගිරි සිතුවම්වලින් නිරූපිත කාන්තාවන් ය.

සීගිරිය නැරඹීමට පැමිණි ජනයාගෙන් සීගිරි ගී ලියූ අයට දිගු නිර්මාණ කරමින් බොහෝ වෙලා රැඳී සිටීමට තරම් සීගිරිය සුකර ස්ථානයක් නොවී ය. අසීරු ඉරියව්වක හිඳිමින් දිගු කවි තනමින් ගල් මත සටහන් කිරීම දුෂ්කර වූ හෙයින් සැකෙවින් තම සිතැඟි ගල් පවුර මත සිත්තම් කරන්නට නන් දෙසින් පැමිණි නිර්මාණකරුවන් උත්සුක වන්නට ඇත. ඒ අනුව 'සැකෙවි කවි' නැතහොත් 'මුක්තක' රචනා කළ සීගිරි කවීන්ගේ කවිත්වයේ සාරය මෙම ගීවල ගැබ් වී ඇත. සීගිරිය, කාශ්‍යප රජතුමාගේ පාලන මධ්‍යස්ථානය වූයෙන් එහි නොසැලකිල්ලෙන් අසභ්‍ය, ග්‍රාම්‍ය කිසිවක් සටහන් කිරීමට කිසිවෙකු හෝ ඉදිරිපත් වූ බවට සාක්ෂ්‍ය දැනට ප්‍රකාශිත සීගිරි ගී අතරින් හමු නොවේ. තමාගේ කවි සිතිවිලි සරල ව සංක්ෂිප්ත ව සටහන් කළ ඒ නිර්මාණ 'සීගිරි ගී' නමින් ප්‍රසිද්ධ වී ඇත.

'සීගිරි කැටපත් පවුරේ ඇති මුළු ගී ගණන 685කි. ඒ ගණන අපේ මහකවක ප්‍රමාණයට සම ව පවතී. එහෙයින් ලබා ගත යුතු එළිය මහකවක සාහිත්‍යාලෝකය තරමට ම පැතිර පවතී' (සන්නස්ගල, 1961: 52). බොහෝ 'සීගිරි ගී' ප්‍රතිනිර්මාණ වශයෙන් හැඳින්විය හැකි ය. පර්වතය ආශ්‍රිත ව කාන්තා සිතුවම් සහ පහළ ගුහාවලින් තවත් විවිධ සිතුවම් හමු වී ඇතැයි පැවසුව ද වැඩි වශයෙන් සීගිරි ගී රචනා කළ අයගේ අවධානය යොමු වී ඇත්තේ කාන්තා බිතුසිතුවම් කෙරෙහි ය. දිගැසියන්, රන්වනුන්, හිමියඹුවන් වැනි යෙදුම් සීගිරි ගීවල බහුල ය. ඒ අනුව සීගිරි බෙයදෙහි ඇති කාන්තා සිතුවම් ආශ්‍රයෙන් බොහෝ සීගිරි ගී නිර්මාණය වී ඇත. ඒවා නිර්මාණයක් ආශ්‍රයෙන් බිහි වූ තවත් නිර්මාණ විශේෂයකි.

වර්තමානය වන විට සීගිරි බිතුසිතුවම් විස්සකට ආසන්න ප්‍රමාණයක් අක්ෂිගෝචර වුව ද අතීතයේ මේ ප්‍රමාණයට වඩා සිතුවම් පැවති බවට සාධක සීගිරි ගී අතරින් ම හමු වේ. වීරාවිදුර්බන කවියා විසින් රචනා කරන ලද දීර්ඝ රචනාවක දෙ වන කොටසෙහි 'ගිරි තෙලෙහි වූ පන්සියයක් අඟනුන් රිසි සේ බලා, එකියක පිළිබඳ මනා සේ මෙනෙහි කළ හෙයින්... ' යනුවෙන් සඳහන් කරයි.

... **පන්සිය අග්නන්** රිසිසෙය් බලයි ගිරි තෙ(ළෙ)
නොග(නියි ස)ග් මෙනෙ මය් එකක් මෙ(නෙහි) කොට් මනා කොට් (249 ගීය)
නොහිඳ කසුන්ගිරිරද් අප සිරිලක් සිහිගිරි පසු

**පන්සිය අග්නන්** සග යන්නා කෙළෙ පසු ... (44 ගීය) යනුවෙන් තවත් ගීයක ලංකාවේ පිහිටා ඇති සීගිරි පර්වතය නිසා මහාමේරු පර්වතය පරාජය වූ බවත් මේ පන්සියයක් අඟනන් දෙව්ලොව බලා යන ගමන පමා කළ බවත් සඳහන් වී ඇත. සල බුදු නමැත්තා ලියූ සිව් පද ගීයක 'නිරිඳුගේ ශිඛා මාණික්‍යය බඳු ප්‍රභාවෙන් යුතු පන්සියයක් අඟනන් ද කැටපත් පවුර ද සිත් සතුටින් බැලුවෙමු' (මුදියන්සේ,2004:456) යනුවෙන් සඳහන් ගීයකි.

සිරිලක්දිවැ පිහිටි සිරිබර සිහිගිරි
එ(න මෙ) පතා දනන් මන ගන්නා ගිරි
**පන්සියයක් අගනන්** නිරින්දු සිකා සිරි
බැලූමො කැට්තල් යහවන් වැ සසිරි (560 ගීය)

පැරණි සාහිත්‍යයේ දී රජතුමාගේ අන්තඃපුර කාන්තාවන් හැඳින්වීමට 'පන්සියයක් අඟනන්' යන යෙදුම භාවිත විය. පන්සියයක ප්‍රමාණය අතිශයෝක්තියක් වශයෙන් සැලකුව ද සීගිරි ගී අතර ඇතැම් නිර්මාණවල සඳහන් චිත්‍ර අද විද්‍යමාන නොවන නිසාත් ඇතැම් පර්යේෂකයන්ගේ නිරීක්ෂණ නිසාත් සත්‍ය වශයෙන් ම දැනට ඇති ප්‍රමාණයට වඩා බිතුසිතුවම් පැවති බව පිළිගැනීමට සිදු වේ. 'පුරාතන ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව' කෘතියෙහි විස්තරාත්මක ව මේ පිළිබඳ සඳහන් වී ඇත.

> සීගිරි පර්වතයෙහි මෙවැනි චිත්‍ර පිහිටා ඇත්තේ එක ම තැනක පමණක් නොවේ... ඒ. බී. ඩී. ඊ. යනුවෙන් හඳුන්වන ලද කෙවෙනි කිහිපය තුළත් චිත්‍ර පැවති බව පුරාවිද්‍යා දෙපාර්තමේන්තු වාර්ෂික වාර්තාවලින් පමණක් නොව දැනට ශේෂ වී ඇති චිත්‍ර කොටස්වලින් ද හොඳින් තහවුරු වේ. මේ අනුව 'ඒ' කෙවෙනියෙහි චිත්‍ර 05 ක් ද,'බී' කෙවෙනියෙහි චිත්‍ර 17 ක් ද, 'ඩී' කෙවෙනියෙහි එක් චිත්‍රයක් ද, 'ඊ' කෙවෙනියෙහි චිත්‍රයක කොටසක් ද යනුවෙන් සිතුවම් රෑ සක් ශේෂ වී තිබේ (සෝමතිලක, 2004:31).

සීගිරි සිතුවම් පිළිබඳ අවධානය යොමු කළ දෙස් විදෙස් උගත්හු බොහෝ වූහ. ඉංජිනේරුවකු වූ මරේ බිතුසිතුවම් ගුහාවට නැග ඒවා පිටපත් කළ මුල් ම තැනැත්තා විය. '1891 දී එවකට ශ්‍රී ලංකාවේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ව සිටි ඒ. මරේ නමැත්තා සීගිරියේ චිත්‍රවල පිටපත් සකස් කළේ ය' (සෝමදේව, 1992:22). 'සීගිරි චිත්‍ර පිළිබඳ කාලය වශයෙන් පිළිගැනීම වන්නේ ඒවා ක්‍රි. ව. 477- 495 තරම් කාලයක දී නිමවන බව යි' (අමරසිංහ, 2005:113). 'මෙම සිතුවම්වලින් ගම්‍ය කෙරෙන්නේ චිත්‍ර ශිල්පියා සිය තෙලිතුඩ ඔහුට අවනත කර ගනිමින් ඉතා ඉක්මනින් චිත්‍රය ඇඳ ඇති බව ය' (චාල්ස්, 2001:25). 'සීගිරි සිතුවම් ක්‍රි.ව. හයවෙනි සියවසට අයත් වන බවත් එම කාලය අජන්තාවේ ද ඉතාමත් දියුණු කෘතීන් බිහි වූ අවධිය බවත් සඳහන් කරයි' (විජේසේකර, 1964:26) යනාදි වශයෙන් සීගිරි බිතුසිතුවම් පිළිබඳ විද්වතුන් ඉදිරිපත් කර ඇති අදහස් කිහිපයක් සාරාංශ කළ හැකි ය.

සීගිරි බිතුසිතුවම්වලින් නිරූපණය කෙරෙන්නේ කවුරුන් ද යන විමසුම සීගිරි ගී රචනා වන අවධියේ පවා තිබෙන්නට ඇතැයි සිතීමට තුඩු දෙන කරුණු සීගිරි ගීවලින් හමු වේ. ඒ අනුව මේවායෙහි නිරූපිත කාන්තාවන් කවුරුන් ද? යන ප්‍රශ්නයට පිළිතුරු සෙවීම ඇරඹී ඇත්තේ ක්‍රිස්තු වර්ෂ 8 වන ශතවර්ෂයේ දී බව වජ්‍රවර්මන් නම් වූ සංස්කෘත පඬිවරයා රචනා කර ඇතැයි සඳහන් කෙරෙන මෙම ගීයෙන් පැහැදිලි වේ.

පීන පයෝධර හාරා - ලලිත සාරස රචිත තනු මධ්‍යා
නිලේන්දීවර නයනා - **කෙයං** මනෝරාමා රාමා (පරණවිතාන, 1959:05).

(පිරුණු පයෝධර බරින් ඈ බර වී හිඳී. ඇගේ සිහින් ඉඟ අලංකාර මෙවුල් දමකින් අලංකාර වී ත. ඇගේ නෙත් නිල් ඉඳුවර මල් මෙනි. චිත්තහාරී වූ මේ ලලනාව කවුරුන් ද?) (එම).

සීගිරි ගී ලියූ අය විවිධ නම්වලින් මේ කාන්තා බිතුසිතුවම් හඳුන්වා තිබීමෙන් ද සීගිරි ගී ගැඹුරින් අධ්‍යයනය කිරීමේ දී ද ඔවුන් මේ චිත්‍රවලින් නිරූපිත කාන්තාවන් පිළිබඳ තම අදහස් ඉදිරිපත් කර ඇති බවට අනුමාන කළ හැකි ය. ගී රචනා වූ අවධිය වන විට ද බිතුසිතුවම්වලින් නිරූපිත කාන්තාවන් පිළිබඳ නරඹන්නන් බොහෝ දෙනෙකුට මේ ගැටලුව පැවති බව සීගිරි ගී පිළිබඳ විමර්ශනයක දී අවබෝධ වේ.

එකල පැවති මේ කරුණ පිළිබඳ සවිඤ්ඤාණික වූ සිවු නමැති පුද්ගලයා ද ඒ කරුණු සියල්ල සිතා බලා තමා ගැටලුව විසඳන ආකාරය පිළිබඳ සීගිරි ගී අතුරෙහි සඳහන් කර ඇත්තේ 'පැන නැගී ඇති මේ කරුණ පිළිබඳ ඒ කියූ කරුණු සියල්ල ම ගැන සිතා බලා මම ද මෙසේ විසඳමි. (එනම්) දෙවඟනන් මිහිතලයට බටුවාක් මෙනි' (මුදියන්සේ,2004:201) යනුවෙනි. ඔහුගේ අදහසට අනුව මේ කාන්තාවන් දිව්‍යාංගනාවන් බව වක්‍ර ව මෙසේ පවසා සිටියි.

ස්වස්ති මිති ... න(සි) යෙරුන සි ... සිවු ගී
මමජ් මෙසෙ(යි)න මෙ උපන් පැය්හි විසජමි
දී සි(ත්හි එ) සියල් ව(න)සරන් බට් මිහිතෙලෙ (98 ගීය)

පසුකාලීන ව සීගිරි බිතුසිතුවම්වලින් නිරූපිත කාන්තාවන් පිළිබඳ පුරාවිද්‍යාඥයෝ සහ නොයෙක් විද්වත්හු ද විවිධ සාධක කෙරෙහි අවධානය යොමු කරමින් අදහස් ප්‍රකාශ කළහ. 'සීගිරි සිතුවම් පිළිබඳ අධ්‍යයනය කළ බොහෝ දෙනෙකු එම සිතුවම්වල ඇති කාන්තාවන්ගෙන් නිරූපණය වන්නේ කවුරුන්දැයි සෙවීමට උත්සුක වී තිබේ. සීගිරි ඉතිහාසය එහි වටපිටාව මෙන් ම මේ චිත්‍රවල ඇති ඇතැම් සුවිශේෂතාවන් ද පාදක කර ගනිමින් ඔවුන් මේවාට නොයෙක් අර්ථකථන දී තිබේ (අමරසිංහ,2005:136). මෙම පර්යේෂණයේ දී සීගිරි බිතුසිතුවම් පිළිබඳ ඉදිරිපත් කර ඇති මත පිළිබඳ අධ්‍යනයයේ දී සීගිරි ගීවල උපයෝගිතාව පිළිබඳ විමර්ශනයක් සිදු කරන ලදි.

සීගිරි බිතුසිතුවම්වලින් නිරූපණය වන්නේ කාශ්‍යප රජුගේ බිසෝවරුන් සහ සේවිකාවන්, දිව්‍ය අප්සරාවන්, මල් වැසි වස්සන අප්සරාවන් සහ ඔවුන්ගේ සේවිකාවන්, දිය කෙළියට යන අන්තඃපුර කාන්තාවන්, කාශ්‍යප රජුගේ දියණියන් වන බෝධි සහ උත්පලවණ්ණා කුමාරිකාවන්, පිදුරංගල විහාරයට වන්දනාවේ යන අන්තඃපුර කාන්තාවන් වැනි අදහස් ඉදිරිපත් වී ඇත. වඩා ප්‍රචලිත අදහස 'මෙම කාන්තා රූපවලින් විදුලිය සහ මේඝය නිරූපණය වේ' යන පරණවිතාන ඉදිරිපත් කළ අදහස යි. **'පුරාතන ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව'** ග්‍රන්ථයෙහි පසුකාලීන විචාරකයන් විටින් විට පළ කළ මතවාද කිහිපයක් මෙසේ සාරාංශ කර ඇත.

I. කාශ්‍යප රජුගේ රාජ සභාවෙහි සිටි කාන්තාවන් පිරිසකි.

II. පිදුරංගල විහාරය වන්දනාවේ යන කාශ්‍යපගේ කාන්තාවන් පිරිසකි.

III. කාශ්‍යපගේ වියෝව නිසා රාජ සභාවෙහි සිදු වූ වැලපීමක් නිරූපණය කරන්නකි.

IV. දිව්‍ය භවනයක සිටින දිව්‍යාප්සරාවන් පිරිසකි'

V. උත්සවවල යෙදී සිටින කාන්තාවෝ පිරිසකි.

VI. මහායාන අදහස් පිළිබිඹු කරන චිත්‍ර සටහන් රැසකි (සෝමතිලක, 2004:53).

අද දක්වාත් මේ පිළිබඳ වරින්වර විවිධ මත පිළිබඳ සාකච්ඡා කරන අවස්ථා හමු වේ. ඒ පිළිබඳ සාවධාන වීමේ දී මේ ස්ත්‍රීන් ප්‍රධාන වර්ග දෙකකට සංග්‍රහ කළ හැකි ය. එනම්, 'මෙම සිතුවම් පිළිබඳ ප්‍රකාශයට පත් කොට ඇති මත දෙගණයකට බෙදිය හැකි ය. ඉන් එක් මතයක් අනුව මෙම සිතුවම්වලින් නරයන් නිරූපිත බව පැවසෙන අතර අනික් මතය වනුයේ ඒවායින් දෙවියන් නිරූපිත බව යි' (ද සිල්වා 1990:13) යනුවෙනි.

සීගිරි කාන්තා චිත්‍ර පිළිබඳ ප්‍රථමවරට අදහසක් ඉදිරිපත් කරන ලද්දේ පුරාවිද්‍යා කොමසාරිස්වරයෙකු වූ එච්. සී. පී. බෙල් විසිනි. මල් අත දරා සිටින කාන්තාවන් සීගිරි විහාරය අසලින් ම පිහිටා ඇති පිදුරංගල විහාරයට යන ආකාරය බිතුසිතුවම්වලින් නිරූපණය වන බව ඔහුගේ මතය යි (Archeological Survey of Ceylon Annual report, 1905:16-17). ඒ අනුව කාශ්‍යප රජතුමාගේ බිසොවුන් මල් අත දරමින් පිදුරංගල විහාරයට යන ආකාරය නිරූපණය කෙරෙන බව ඔහුගේ අදහස යි. මේ අවධිය වන විට සීගිරි ගී කියවා ප්‍රකාශයට පත් කර නොතිබුණ ද මල් අත දරා සිටින කාන්තාවන් ගැන කියවෙන සීගිරි ගී හමු වේ.

රන්වනුන් දුටිමො... **රත් අතැ මල් ගත්** (43 ගීය)

රන්වන් කාන්තාවන් දුටිමු. ... රතු පැහැති අතින් මලුත් රැගෙන සිටින

... මා බලමින් **අතින් ගත් මල්** (74 ගීය)

(ඔවුන් අතින් ගත් මල් බලමින් (මෙහි) පැමිණියෙමි.

**මහනෙල් ගත් කතුන් දකුත්** ... (199 ගීය)

මහනෙල් (අතින්) ගත් කතුන් දකිනා කල ...

**නිල් මහනෙල් මලක් අතින් ගැනැ** ගිරි බිත්හි ... (403 ගීය)

නිල් මහනෙල් මලක් අතින් ගෙන පර්වතයෙ සිටි ...

දැකැ ... රන්වනනක **මල්කැන් අතැ** ... (423 ගීය)

රන්වන් කාන්තාවගේ අතෙහි මල් කිනිත්තක් දැක ...

**මහනෙල් මල් සුරත් අතැ** (428 ගීය)

(සුරත් අතෙහි වූ මහනෙල් මල්)

'සීගිරිය සමීපයේ පවත්නා පිදුරංගල විහාරය කේන්ද්‍ර කර ගනිමින් මෙම චිත්‍රවලට බෞද්ධ ආරක් ගැන්වීමට ඇතමෙක් උත්සාහ දැරූහ. කාන්තා රූප පමණක් ඇති නිසා තත් බෞද්ධ මතය ප්‍රතික්ෂේප කරන උගත්හු ද වෙති (රාහුල හිමි, 2012:28).

සීගිරි කාන්තාවන්ගෙන් නිරූපණය කෙරෙන්නේ කාශ්‍යප රජතුමාගේ මාලිගයේ විසූ ස්ත්‍රීන් ය (අමරසිංහ 2005:14) යනුවෙන් ද මතයක් ඉදිරිපත් වී ඇත. සීගිරි බිතුසිතුවම්වලින් නිරූපණය වන්නේ අන්තඃපුර කාන්තාවන් යන මතයට සාක්ෂ්‍ය සපයන සීගිරි ගී ද හමු වේ.

ස්වස්ති තරල්පා වැසි සිරිනාපැවිජේජමි

තිරිද්සිරැ සිටැ බැහැරට් නො(ෙ)ම යම පරවිටි

එවන් වී නැවතැ බලමි(න්) සිටියවුන් වැන්නො (147 ගීය)

තිරිඳාගේ අන්තඃපුරයෙහි සිටි (අපි), ඔහු නැති කල, ඉන් බැහැරට යමු'. එසේ (සිතමින් මෙන්), ඔවුන් නැවතී (ඉදිරිපස) බලමින් සිටියා වැන්න (මුදියන්සේ,2004:395).

ස්වස්ති

ඒ රජ්හු අග්නක් (බැලීමො) ආ අප (ඇ)ස්නි

බලමින් හෙර් සෙයින් බණ(න්නි) අත්(නෙන්) ආ හය් (417 ගීය)

රජතුමාගේ කාන්තාවන් එනම් අන්තඃපුර කාන්තාවන් බැලූ බව සඳහන් ගීයකි. මේ කාන්තාවන් සාමාන්‍ය ජනයාට දක්නට නොලැබෙන හෙයින් මේ බිතුසිතුවම් දැක කවියා 'නරපතියන්ගේ අන්ඃතපුරයට අයත් කතුන් හුදකලාව වාසය කිරීමට සලස්වා තිබුණු බැවින් ඔවුන් බලා ගැනීමට සාමාන්‍ය ජනයාට අවකාශයක් නොලැබිණි' (මුදියන්සේ,2004:376) යනුවෙන් පවසයි.

විවිධ වයස්වල කාන්තාවන් සීගිරි බිතුසිතුවම්වලින් නිරූපණය කෙරෙන බවට ද අදහසකි. 'මෙම සිතුවම්වල ඇති කාන්තා රූපවලින් විවිධ වයස්වල කාන්තාවන් නිරූපණය කෙරේ. එසේ ම විවිධ මුහුණුවරින් සහ විවිධ හැඟීම්වලින් යුත් ස්ත්‍රීන් මේ තුළින්

නිරූපණය කෙරේ. නව යොවුන්, යොවුන්, මැදි වියේ සහ වයස්ගත කාන්තාවන් ද මේ අතර වේ (මනතුංග,1985:53). නන්දදේව විජේසේකර ද විවිධ වයස්වල කාන්තාවන් සීගිරි බිතුසිතුවම්වලට විෂය වූ බව දක්වයි (1964:73) මෙම ප්‍රකාශය හා සම්බන්ධ කළ හැකි සීගිරි ගී අතර වයෝවෘද්ධ කාන්තාවන් පිළිබඳ ඉඟි කරන මේ ගීය වැදගත් වේ.

තිත්මි පැරැද්දැ යෙමින් ලීමි.

... නැතැප් එ **කලු** රුතු **ගැළ** ගී හොවිත් බිමා

**නො කෙල්ලන්** වීයින් කියය් අ සි කැරෙය් කිමැ (251 ගීය)

'මේ කාන්තාවන්ට ඍතු වීමක් නොමැති වුව ද (ඔවුහු) වෙන් වී (එහි) වැටී, බිම හොවිත්. ඔවුන් කෙල්ලන් නොවන හෙයින්, ඔවුන්ට කීමෙන් කුමක් සිහි කැරෙයි ද? (මුදියන්සේ, 2004: 281). 'ඍතුවීම පවත්නා සමයෙහි බිම හෙවැ නිදීම පැරණි කල ලක්දිව ස්ත්‍රීන්ගේ සිරිත විය..' (මුදියන්සේ, 2004: 282). ඍතු වීමක් නොමැති කාන්තාවන් යනුවෙන් අදහස් කරන්නේ වයෝවෘද්ධ කාන්තාවෝ ය. වැහැරුණ පියවුරු ඇති රන්වන් කාන්තාවන් බැහැර කොට යන ලෙසට බිජෙර්වතුකුළියෙහි අග්බෝ ලියූ ගීයකි මේ. (බි)ජෙර්වතුකුළියෙ ..... අග්බොහි ගී.

එ නො බලයු ජහ යම්හ **රනවන බට්තන**

බණවන නො මෙ බණයු ගිරි හිස්හි නට්බිත වසනෙන් (71 ගීය)

මේ කාන්තාවන් තමන්ගේ ළපටි පයෝධර රන් පටියකින් බැඳ සිටි බව මේ කවියා කියයි. 'ළ තන' යනු ළපටි පයෝධර යන අරුත් දේ (මුදියන්සේ, 2004: 403). තමන් වර්ණනා කරන්නේ ළාබාල තරුණියක බවට කතුවරයා ව්‍යංගයෙන් එසේ ඉඟි කරයි.

මහනෙල් මල කනැ (ලි) නවත බද් (දුල්) පට් රන්

තන ළ උඩ්වටු තනන පැහැ රන්වන් සිහිගිරි (467 ගීය)

අවයව පිරිහුණු කාන්තාවන් පිළිබඳ ව ද 'අඟ පිරිහිණ් ද දැකුමකුජ් ඇති ... (456 ගීය ) සඳහන් සීගිරි ගීයකි. එහෙත් නන්දසේන මුදියන්සේ 'සීගිරි කතුන්ගේ රූ ඉඟටියෙන් පහළට නොදක්නා ලැබෙන හෙයින් මෙසේ කියා ඇත්තේ ය' (2004:395) යනුවෙන් සඳහන් කර ඇත.

මුහුණුවල ඇති ශෝකී ස්වභාවය නිසා කාශ්‍යප රජතුමාගේ වියෝවෙන් දුකට පත් වී වැළපෙන කාන්තාවන් සීගිරි සිතුවම්වලින් සිත්තම් කර ඇතැයි නන්දදේව විජේසේකර **පැරණි සිංහල බිතු සිතුවම්හි** සඳහන් කර ඇත (1964:55). සැලකිය යුතු සීගිරි ගී ප්‍රමාණයක මේ චිත්‍රවලින් නිරූපණය වන්නේ කාශ්‍යප රජතුමාගේ බිසෝවරුන් බවට ඉඟි කරයි. 'නිරිඳු හිමියාගෙන් වියෝ වූ හෙයින් බෙයදෙහි රන්වනුන් සොවින් මිය යම්හ'යි කියමින් ගල මුදුනින් පහතට පනින අයුරු ය' (මුදියන්සේ 2004:257) යනුවෙන් සඳහන් ගීයකි.

... බෙයන්ද්හි රන්වනුන් **නිරින්ද් (ඉ)සිරා වියෙව්හි**

මෙසිනි මියහෙම්හයි ගල් ඇගැනි හෙනයුන් වැන්නො (247 ගීය)

මෙම ගීයෙහි සඳහන් 'රජතුමාගෙන් වියෝ වූ' යන අදහස වැදගත් වේ. පරණවිතාන මෙම ගීයට දක්වා ඇත්තේ 'we shall die' out of grief in (their) separation from (their) load, the king' (Paranavithana,151-152) යනුවෙනි. රජතුමාගෙන් වියෝ වූ කාන්තාවන් රන්වනුන් යනුවෙන් හඳුන්වා ඇත. රජතුමා මිය ගිය නිසා මේ කාන්තාවන් කිසිවෙකු සමග කතා නොකරන බව දක්වා ඇති කවියකි මේ.

කියෙ ලය සිවලු ගී

තනරන්මලී වෙණ අතිනි ගත් හො රන්වන් ලී

**නිරිඳු මෙළෙන්** එකල් නො මෙ බෙ(ණෙයේ) අන් න්න හය් යාවත් (19 ගීය)

'නිරිඳු මරණයට පත් වී ඇති නිසා රන් මලකින් පියයුරු අලංකාර කර ගෙන වීණාව අත දරා සිටින ස්ත්‍රිය අන් කිසිවෙකු හා කතා නොකරයි' යනුවෙන් ලය සිවල නමැත්තාගේ ගීය මහමෙත් ලියා ඇත. හිමියාගෙන් වියෝ වූ හෙයින් මේ තැනැත්තිය පර්වතයට නැග හිඳින්නී ය '**නිරින්ද් ඉසිරා වියොවිනි** කී යැ මැය ගල නැගැ... (569 ගී) යනුවෙන් මිහින්දල් ලියූ කවියකි.

බුදල්මි ගී.

නිරින්දු මළ බව අසයි ආ (ෙ)ම හෙළිල්ලබුයු(න්)

මියමො (ගත්) මල් හයි සෙලගින් හෙන්නනුන් (වැන්නො) (584 ගීය)

බුදල්මි සටහන් කර ඇත්තේ 'රජතුමා මළ බව අසා මෙහි පැමිණි මේ රූමතියෝ (අපි) මිය යම්හ'යි (කියමින් අතින්) ගත් මල් සමග පර්වතය මුදුනින් පතින ආකාරය (ගත්තාභූය)' (මුදියන්සේ 2004:469) යනුවෙනි. රජතුමා මරණයට පත් වී ඇති හෙයින් ශෝකය වාවා ගත නොහැකි ව රන්වනුන් බෙයදෙහි සිටි බව 'නරනින්ද් ලයු මෙළෙයින් සෙවින් ළ නො වහන්නෙන් ... (300 ගීය) යන ගීයෙන් කියවේ. කාශ්‍යප රජතුමා වියෝ වූ ස්ත්‍රීන් මේ බිතුසිතුවම්වලින් නිරූපිත බවට සීගිරි ගී ලියූ අය ද විශ්වාස කළහ. බිතුසිතුවම්වල ස්ත්‍රීන් පැලඳ සිටින ආභරණවලින් සහ සැරසී සිටින ආකාරයෙන් ශෝකී අවස්ථාවක් නිරූපණය වන්නේ ද යන්න විමර්ශනය කළ යුතු තත්ත්වයක් වුව ද මේ රාජකීය කාන්තාවන් බව ද අමතක නොකළ යුතු ය.

සීගිරි ලලනාවන් කවුරුදැයි හඳුනාගන්නට වෙර දැරූ අය අතර ආනන්ද කුමාරස්වාමි ද වැදගත් වේ. 'සීගිරි චිත්‍රවල පහත කොටස සම්මත වලාකුළුවලින් කැපී තිබෙන හෙයින් අප්සරාවන් නිරූපිත බව මගේ අදහස යි. අප්සරාවෝ නූතන චිත්‍රයන්හි හැම විට ම මෙසේ නිරූපණය කෙරෙත්' (කුමාරස්වාමි, 1962:176). සීගිරි ගී රචනා කළ අය අතර සීගිරි

බිතුසිතුවම්වල ඇඳ ඇත්තේ අප්සරාවන් යැයි සිතූ අය සිටි බවට ද සීගිරි ගී අතරින් සාක්ෂ්‍ය හමු වේ. වලාකුළෙන් මතු වී එන ආකාරයෙන් ඇඳි සිතුවම් මේ අදහස ඉදිරිපත් කිරීමට හේතු වන්නට ඇත.

**.... අසරන් බට් මිහිතෙලෙ (98 ගීය)**

... දෙවඟනන් මිහිතලයට බැස්සා වගේ

සගැ දිට්මි **අසරනන්** සිටි සෙ මෙ බෙයන්ද්හි සිරින් ... (104 ගීය)

... බෙයදෙහි සෝභාව නිසා ස්වර්ගයෙහි සිටින අප්සරාවන් සිටි ආකාරය දිටිමි.

(ස්වස්ති) සහජ පියනට් නො මෙය්හි **සරන්** (අන්ද්)ව තුබූ ....(175 ගීය)

(අප්සරාවන් මෙහි අඳවා තුබුයේ සහජ ප්‍රියයන් සඳහා නොවේද?

... නිව ගිම් දිව අසර අස මෙහි හා (178)

(ගිම් නිවා දිව්‍යාප්සරාව මෙහි අසලට ආවා ය)

සීගිරි පර්වතයට මුදුනට ගිය විට සීගිරි බෙයදේ ඇති කාන්තා රූප දිව්‍ය අප්සරාවන් සේ නරඹන්නන්ට පෙනීම අරුමයක් නොවේ.

ස්වස්ති

තොප නුයුන මිණිවිට්නි වැම්හෙන පැහැ දිසෙ(ය්)

නො කළෙ ත(ම)න් තෙ(මම්) එ ඉන් (ද)නිම් තොප සුර බව (50 ගීය)

මිණි පහනින් වැම්මෙන පැහැය තොප නුවන්වලින් දිස්වෙයි. (නුවන්හි වූ) ඒ ශොභා විහිදීම තමන් (ආයාසයෙන්) කළ දෙයක් නොවෙයි. එහෙයින් තොපගේ දිව්‍යමය භාවය දනිමි (මුදියන්සේ 2004:178). මේ ලලනාවන් දිව්‍යාංගනාවන් බව ව්‍යංගයෙන් පවසන සීගිරි ගීයක් ද මේ අතරෙහි හමු වේ.

ජෙරෙන් මිරිකෙයි යොවුන් පෙළෙයි ක(ය) වියයින් නෙක

(වෙ) ජිවි නි(යතින්) හී යනෙ මෙ හින්දියෙව් එ නැත්තයුන්

(කි)ත්මි ලීමි මෙ ගී. (549 ගී)

කිත්මි ලියන ගීයෙහි අරුත් වන්නේ 'යොවුන් බව ජරාව නිසා මිරිකෙයි. නොයෙක් ව්‍යාධීන් නිසා ශරීරය පීඩා වෙයි. නියතින් ම ජීවිතය ක්ෂය වී යන්නේ වෙයි. එබඳු (තත්වයක්) නොමැති ඇත්තන් මෙහි හිඳිනා සේ ය' (මුදියන්සේ, 2004:449). යෞවන බව විනාශ නොවේ නම් ජරාවට පත් නොවේ නම් රෝගී නොවේ නම් ඒ දිව්‍යාංගනාවෝ ය. සීගිරි ගී අතර ද මෙසේ බිතුසිතුවම්වලින් නිරූපණය වන්නේ අප්සරාවන් බවට සඳහන් ගී හමු වේ. 'සීගිරි සිතුවම්වල නිරූපණය වනුයේ සීගිරියෙහි නිවැසි සුපේශල ශික්ෂාකාමී

යෝගාවචර භික්ෂූන්ට අහසෙහි සිට වලාකුළු අතුරෙන් පෙනී සිට මල් හෙලමින්, මල් වැසි සංකේතවත් කරන භක්ති ප්‍රණාම බරින් බිමට හෙළූ දෙනෙතින් යුත් අප්සරාවන් බව සිතා ගත හැකි ය (මිරැන්ඩෝ, 1990). **ශ්‍රී ලංකා රාවණ රාජධානිය** කෘතියෙහි 'සීගිරි යුවතීහු නව වල්ලභයන් සොයා යුද බිමට පැමිණි දිව්‍ය අප්සරාවෝ වෙති' (සෙනෙවිරත්න, 2012: 216) යනුවෙන් අදහසක් ද ඉදිරිපත් වී ඇත. **අසිරිමත් ඉන්දියාව** කෘතියෙහි සීගිරි බිතුසිතුවම්වලින් නිරූපණය වන්නේ අප්සරාවන් බවට බෂාම් ද විස්තර කර ඇත.

> පීතෘඝාතක I වැනි කාශ්‍යප නම් රජතුමා විසින් පස්වැනි ශත වර්ෂයේ අග හරියේ දී මෙහි මාලිගාවක් සහ බලකොටුවක් තනනු ලැබී ය. සෑම කාර්යයක් ම ඉහළින් කිරීමෙහි ආශාවෙන් මඩනා ලද අහංකාර තැනැත්තෙකැයි සිතිය හැකි කාශ්‍යප රජතුමා තමන් දේවත්වයෙහි ද ලා සැලකූ හෙයින් තම පර්වත බලකොටුව දිව්‍ය ලෝකයට සමකොට සිතී ය. ඒ අනුව උපදේවතාවුන් සහ නොයෙක් සෙසු දෙවිවරුන්, පර්වත බිත්තිවල අන්දවන ලද්දේ තමා ඒ සියලු දෙවි පිරිසවලට ද වඩා උසස් යයි තම රට වැසියන්ට දනවන්නට ය. මෙසේ අඳින ලද සීගිරි චිත්‍ර බොහොමයක් තද හිරු රශ්මිය සහ මෝසම් වැසිවල පීඩාව නිසා විනාශ මුඛයට ගොස් ඇත. එහෙත් පර්වතයේ මැදක් පමණ වූ එක් තැනක උඩින් පිහිටි ගල් පියස්ස නිසා ආරක්ෂා වී ඇති අප්සරාවන්ගේ චිත්‍ර විසි එකක් වෙයි. මෙම අප්සරාවන්ගේ උකුලේ සිට පහළ කොටස වලාකුළින් වැසී ඇත (බෂාම්, 1995:479).

සෙනරත් පරණවිතානගේ මතය වූයේ සීගිරි චිත්‍රවලට වස්තු විෂය වී ඇත්තේ විජ්ජුලතාවන් සහ මේඝලතාවන් බව යි (1971:28). විදුලිය සහ මේඝය සීගිරි බිතුසිතුවම්වලින් සංකේතවත් වන බව ඔහු විශ්වාස කළේ ය. සීගිරි ගී අතර රන්වන් කාන්තාවන් විදුලිය වැනි යැයි පැවසූ සීගිරි ගී ද හමු වේ. බෙයද කුසෙහි පැහැපත් විදුලිය වන් වූ රූමත් වරඟනන් දැක සිත්තරා කෙසේ නම් දැඩි ශෝකය නිවා ගනියි ද? (මුදියන්සේ,2004:248) යනුවෙන් මේ ලලනාවන් විදුලිය වැනි වරඟනන් යනුවෙන් දක්වා ඇත.

> කිම්ජබරවිල්හි අත්යුගලෙන් ඉගිලී
>
> ගෙලෙ ග විජලි ... (178 ගීය)

ආකාශය නමැති තඩාගයෙහි කිම්ද අත් යුගලය නමැති පියාපත්වලින්) ඉගිලී විදුලිය නමැති (ලතාවන්) ගෙලෙ ලා ... (මුදියන්සේ,2004:241) ලෙසින් කළ සඳහන ද පරණවිතාන මතයට සමීප අදහසකි. කවියා සීගිරිය පැමිණ කාන්තාවන් සිටි බව නොදැන විදුලි ධාරාවක් විහිදෙන අයුරු නිරීක්ෂණය කරද්දී බෙයදෙහි සිටි රන්වන් කාන්තාවන් දුටු බව කියවෙන ගීයකි. පරණවිතාන මතය හා සම්බන්ධ වන එම ගීය මෙසේ ය.

> ... විදුකි(ද) මත (ඇ)ති ද එබිමො (දි)සි තක් දි(ටි)වි
>
> වියෙවුන් බඳුන් බෙයදිගි රන්(වනු)න් නො(මෙ වී) බූණ (555 ගීය)

උඩින් විදුලි ධාරාවක් ඇතිදැයි එබී (බැලීමු). දිස්වන තාක් (සියල්ල) දුටුයේ වී. බෙයදෙහි සිටි වියෝවූවන් බඳු රන්වන්හු කථා නො ම කළාහු ය (මුදියන්සේ,2004:453). රන්වන් කාන්තාවන් විදුලි ධාරාවක් බව කිතල නමැත්තා ගීයක මෙසේ සඳහන් කරයි.

දැකැ තර් නිවය් කිසෙය්නි සිත්වර් සා ළළයුන්

බෙයන්ද්කිසැ සහරා විජ්ලිය වන් වූ වරඟනන් (192 ගීය)

බෙයද කුසෙහි පැහැපත් විදුලිය වැනි වූ රූමත් වරඟනන් දැක සිත්තරා කෙසේ නම් දැඩි ශෝකය නිවා ගනීදැයි අසන මෙම ගීය ක්‍රිස්තුවර්ෂ 9 වන ශතවර්ෂයේ රචනා වූ ගී අතර හමු වේ.

> සීගිරිය ආලකමන්දාවෙ ආකාරෙට හදල කාස්සප රජ්ජුරුවො එතැන කුවේරය වගෙ විසුවයි කියනව....ආලකමන්දාව පිහිටල තිබුණෙ කයිලාස පරුවතෙ උඩලු. කයිලාස පරුවතෙ අවට නිතර යාම් ඊම් කරන දෙවසරන් දක්වන්නයි වලාකුළුවලින් නගින මේගලතාවනුත් විජ්ජුකුමාරියනුත් ගලේ මූණතෙ ඇදල තියෙන්නේ (පරණවිතාන,1969:28).

කව්සිළුමිණ මහා කාව්‍යයෙහි දියකෙළි වැනුම සමඟ සීගිරි සිතුවම් පිළිබඳ සාකච්ඡා කරන වික්‍රමසිංහ දක්වන්නේ 'සීගිරියේ ඇතැම් රූප දිය කෙළියට බැස්සා වූ ස්ත්‍රීන් යයි ගැන්මට බාධාවක් නැත' (1960:96) යනුවෙනි. සීගිරි චිත්‍ර අතර එක් සිතුවමක මල් මාලය කෙළවර මල් කලඹ පැහැදිලි ව පෙනෙතත් වමතින් ගත් මල් දම් කෙළවර මල් කළඹ දියෙහි නිමග්න වූ ආකාරයෙන් පෙනෙන බවත් වික්‍රමසිංහ තව දුරටත් සඳහන් කරයි. 'සීගිරි සිතුවම් කියන්නේ උයන් කෙළියෙන් පසු දිය කෙළියට බට කාශ්‍යප රජුගේ අන්තඃපුර වධූන් බැව් තීරණය කිරීමට මෙය ද සාක්ෂ්‍යකැයි හැඟේ (වික්‍රමසිංහ,1960:96).

සවස්ති

දැකැ අයුත් තමන් දහරදිහි සෙදි යන්නන්

බෙයන්දිහි රන්වනුන් ඇජ ගිය සෙයි කසුබ්රජ්පයි (153 ගීය)

'යහපතක් වේවා. තමා ම පැමිණ දිය දහරෙහි සේදී යන්නවුන් දැක (එ) රන්වනුන් බෙයදෙහි සිත්තම් කොට කාශ්‍යප රාජාපාදයන් ගිය බඳු ය' (මුදියන්සේ, 2004:228). මෙම ගීය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී 'දිය දහරෙහි සේදී යන්නවුන් දැක' යන අදහස මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් වැදගත් වේ. පට රෙද්දක් එක් අතකින් ද මුතු වැලක් එක් අතකින් ද ගත් කාන්තාවක ගැන ද රන්වන් අතින් පිළියක් ගත් කාන්තාවක ගැන ද සඳහන් ගී දෙකක් ද සීගිරි ගී අතර වෙයි.

බෙයන්ද්හි සම්වනක් ළ මය් ගත යැහැයෙන්

මුතු වැළැ එක් අතින් එක් අතිනි ගත් පට් වැරැල්ලක් ... (230 ගීය)

... රත අතිනි ගත එක වැරලි කදහස බැලි ද මෙ ... (223 ගීය)

මෙම ගීවලින් ගම්‍ය වන්නේ රෙද්දක් අතේ සිටින කාන්තාවක රන්වනුන් අතරේ සිටි බව යි. දිය කෙළියට යන කාන්තාවන් පිළිබඳ අදහස් සාකච්ඡා කිරීමට මෙබඳු ගී වක්‍ර ව උපස්තම්භක වේ.

'සීගිරියේ දක්නට ලැබෙන අප්සරා චිත්‍රවලින් කාශ්‍යප රජු යුද වීරයෙකු ලෙසත් දිව්‍යමය ප්‍රණාමය ලබන බවත් සංකේතවත් වන බව මගේ අදහස ය' (මනතුංග,2004:56) යනුවෙන් ඉදිරිපත් වී ඇති අදහසකි. අප්සරාවන් යුද ජයග්‍රහණයට ප්‍රණාම දක්වන බවට එන සාහිත්‍යමය සාධක ද, මේ චිත්‍ර නිර්මාණය කර ඇති ස්ථානයේ එවැන්නකට ඇති උචිත භාවය ද කුරුටු ගී ලියූ කවියන් මේ අප්සරාවන් තේරුම් ගෙන ඇති ආකාරය ද අනුව ඒ අදහස තහවුරු කළ හැකි ය (එම). මෙවන් අවස්ථාවක් ඉතා ප්‍රීතිමත් අවස්ථාවකි. මේ සීගිරි ලලනාවන් යුද වීරයෙකු ලෙස ප්‍රණාම ලබද්දී ඒ කතුන් නැටුම් ගැයුම් වැයුම් කරන්නට ඇත. සීගිරි ගී අතර ද මේ අදහසට සාක්ෂ්‍ය සපයන ගී හමු වේ. රන්වන් කාන්තාව ගායනා කිරීමේ ආශාවෙන් වීණාව උරහිසට ළංකොට වයමින් (සිටියා ය) ... යනුවෙන් සඳහන් ගීයකි මේ.

ගන රිසි කොට් වයමිනි වෙණ ඔරත් ළඟ කොට්

තිරිද් ඉසිරා මෙළෙ යි ඇනැ කඩ නො කළ වෙණ රන්වන් (84 ගීය)

තනරන්මලී වෙණ අතිනි ගත් හො රන්වන් ලි ... (19 ගීය)

රන් මලකින් පියයුරු (සාදා) වීණාව අතින් ගත් ඒ රන්වන් ලිය... යනුවෙන් වීණාව අතින් ගත් කාන්තා බිතුසිතුවමක් තිබුණ බවට කියවේ. පර්වතය දෙස බලමින් ගී කියවීම සුබදායක කරුණක් බව කියවෙන 'සුක තොට් ගල බලා සිට **ගී කියවන්නක්** ... (259 ගීය) ගීයක් ද සීගිරි කාන්තාවන්ට සංගීත වාදනය කළ තැනැත්තෙකු ලියූ ගීයක් ද '**... වයනෙ** ම සිහිගිරියෙ තට ... (526 ගීය) සීගිරි ගී අතර හමු වීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

'සීගිරි බිතු සිතුවම් විශ්ව කීර්තියට අසුවී යැ. ඒ හේතුවෙන් කලා ශිල්පීහු මෙන් මැ වෙනත් නොයෙක් උගත්තුද පුරාවිද්‍යාඥයෝ ද විවේචකයෝ ද මේ සිතුවම් නරඹන්නට ඇදී ආහ. ඔහු එය පිරියෙසුම් ඇසින් බලා සිය හැඟුම් හෙළි කළහ' (චාර්ල්ස්, 1958:48). ඉහත සාකච්ඡා කරන ලද කරුණු අනුව සීගිරි බිතුසිතුවම් සම්බන්ධයෙන් පළ වී ඇති අදහස් පිළිබඳ සවිඥ්ඥාණක වීමේ දී සීගිරි ගී අතර ද ඒ අදහස්වලට සාක්ෂ්‍ය සපයන ගී සොයා ගත හැකි බව අනාවරණය වේ. 'සීගිරියෙහි මණ්ඩෝදක කුටි නැරඹීමට යන සෑම ගමනක් ම එහි සිතුවම් ගැන ආවර්ජනා කරන සෑම අවස්ථාවක ම ඒවා පිළිබඳ කිසියම් අලුත් තොරතුරක් සොයා ගැනීමකට තුඩු දෙයි. මෙම සිතුවම් ගැන තවමත් බොහෝ දේ ලීවිමට ඇතැයි යනු මගේ හැඟීම යි' (ද සිල්වා, 1990:06).

සීගිරි ගී ප්‍රකාශයට පත් වීමෙන් පසු ඉදිරිපත් වී ඇති මත කෙරෙහි ද සීගිරි ගී ප්‍රබල සාක්ෂ්‍ය වශයෙන් යොදා ගත් බවක් නොපෙනේ. මෙනයින් සීගිරි ගී සහ බිතුසිතුවම් පිළිබඳ විමර්ශනාක්ෂිය යොමු කරීමේ දී සීගිරි ගීවල සඳහන් වී ඇති ඇතැම් බිතුසිතුවම් දැනට දක්නට නොලැබීම මේ පිළිබඳ මතයක් ගොඩ නැගීමේ දී ඉතා අවාසි සහගත තත්වයකි. සීගිරි ගී නිර්මාණ විශේෂයක් නිසා ඒවායේ ඇත්තේ නිර්මාණාත්මක අදහස් යැයි කෙනෙකුට තර්ක කළ හැකි ය. එහෙත් සීගිරි කවීන්ගේ භාවමය අද්දැකීම් ප්‍රකාශනය සීගිරි ගීවල විද්‍යමාන බව ද අමතක නොකළ යුතු ය. සීගිරි ගීවල අන්තර්ගතය කෙරෙහි ස්ථානෝචිත ව සහ කාලෝචිත ව මෙන් ම කල්පනාකාරී ව අවධානය යොමු කළහොත් කාන්තා බිතුසිතුවම් පිළිබඳ සඳහන් ගී සහ දැනට ශේෂ ව ඇති සීගිරි චිත්‍ර පමණක් නොව එහි ඇඳ තිබූ බවට සඳහන් වන සියලු සීගිරි බිතුසිතුවම් පිළිබඳ අවධානය යොමු කර සීගිරි ගී සමඟ සංසන්දනාත්මක විග්‍රහයකින් කාන්තා බිතුසිතුවම් පිළිබඳ නිවැරදි අදහසක් ලබා දිය හැකි බව අපගේ විශ්වාසය යි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අමරසිංහ, මාලිංග (2005). **සීගිරිය ලෝක උරුමයක වගතුග.** කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම.

කුමාරස්වාමි, ආනන්ද කේ. (1962). **මධ්‍ය කාලීන සිංහල කලා.** (පරි.) එච්. ඇම්. සෝමරත්න, කොළඹ : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

චාර්ල්ස්, ඇස්. පී. (1958). **සීගිරි බිතුසිතුවම්.** කොළඹ: ලේක්හවුස් සමාගම.

ජයතිලක,කේ. (1996). **සීගිරි ගී - විචාරාත්මක රස වින්දනයක්.** බත්තරමුල්ල : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

තිස්ස කුමාර, ආනන්ද (2005). **සීගිරි ජනශ්‍රැති.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ද සිල්වා, රාජා (1990). 'චිත්‍ර කලාවේ ආදි යුගය: ක්‍රි.පූ. 247 සිට ක්‍රි.ව. 800 තෙක්).' (සංස්.) නන්දදේව විජේසේකර. **පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශත සංවත්සරය: 1890- 1990)- සමරු පොත් පෙළ: පස්වන වෙළුම- චිත්‍ර කලාව.** කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

පරණවිතාන, එස්. (1959). 'සීගිරි චිත්‍ර කුමක් පවසා ද?' කරුණාරත්න විජේතුංග. පේරාදෙණිය (සංස්.) **ඉතිහාසය- 1 කාණ්ඩය. 1 කලාපය.** 10-11 පිටු. විශ්වවිද්‍යාලය : ඉතිහාස දෙපාර්තමේන්තු ප්‍රකාශන.

පරණවිතාන, එස්. (1969). **සිංහලයෝ.** (පරි.) සුචරිත ගම්ලත්, කොළඹ: ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම.

පරණවිතාන, එස්. (2000). **සීගිරි කුරුටු ගී - 1වෙළුම.** (පරි.) සුචරිත ගම්ලත්, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

බෂාම්, ඒ. එල්. (1995). **අසිරිමත් ඉන්දියාව.** බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

මනතුංග, අනුර. (1985). 'සීගිරි චිත්‍ර ශෛලිය පිළිබඳ කෙටි සටහනක්.' **වසුන්දරා - 2 කලාපය පුරාවිද්‍යා අධ්‍යයන සඟරාව.** කැලණිය: කැලණිය විශ්වවිද්‍යාලය.

මනතුංග අනුර (2004). **සීගිරි චිත්‍ර.** ජා ඇල: සමන්ති පොත් ප්‍රකාශකයෝ